## අපට නැද්ද ළමා ලොවක්

සමනළයන් පසු පස දුවන්න
කණාමැදිරි හා සෙල්ලම් කරන්න
වෙල් ඉපනැලි වල වැටි වැටි දුවන්න
නැහැනේ ලොවක් අද අපට උරුමවුණ

ගයා නටන්නට තාල වයන්නට
හිතු හිතු වෙලාවෙ සෙල්ලම් කරනට
ළමා ලෝකයක් නැතිවද අප හට
වැඩිහිටියනි කියලා දෙනු බිඳකට

කොස්කොළ කිරුළත් වියැ ලීලා
පොල්පිති හරකා තනි වීලා
සෙල්ලම් ගෙය අද පාළු වෙලා
පුංචි ළමයි අපි හෙම්බත් වීලා

**ඒ. එම්. නයන තරංග**
**ශ්‍රී ගුණානන්ද ම.ම.විද්‍යාලය**
**බිබිලාදෙනිය Sri Lanka**

## පිවිතුරු පරිසරයක්


ගස්වැල් හැම අපට මිතුරු
අපෙ යුතුකම එය සුරකිමු
පරිසරයේ පිවිතුරුබව
රකිමු අපිත් එය නිරතුරු

අතු අග මල් පිපිලා ඇත
හිතට සතුට ගෙන දෙනු ඇත
සුවඳ හමයි ලෝකය වට
ගස් හින්දයි මේ හැම සැප

ගංගා ඇල හැම පිවිතුරු
රකිමු අපිත් එය සුමිතුරු
ගස්වැල් අප පණයි සිතමු
පණ මෙන් අපි එය සුරකිමු

♦ ***සුපේෂලා වාරුනී***
**දෙබරවැව ජාතික පාසැල**
**තිස්සමහරාමය Sri Lanka**

**ළමා ඔබටයි මේ.**
**මෙම ළමා පිටියේ පළකිරීම සඳහා ඔබේ කවි හා රචනා එවන්න. ලිපිනය 2 වන පිටුවේය.**




## Cats in Egypt මිසරයේ බළල්ලු



Ancient Egyptians used to shave their eyebrows when their pet cats died. Shaving was seen as a mark of respect and a way to cleanse the spirit. Cats were revered almost as gods and killing one was punished by death. If an Egyptian home caught fire, the first duty of the householder was to try to rescue the cat.

**පැ**රණි මිසරවාසීන් සිය ගෙදර ඇතිකරන බළලා මැරුණු විට තම ඇහි බැම ගා දමන සිරිතක් වීය. ඒ බළලාට ගෞරව වශයෙන් හා උගේ ආත්මය පිරිසිදු කිරීම ද පිණිසය. බළලුන් දෙවියන් තරමටම සැලකූ අතර බළලෙකු මැරීම මරණීය දඬුවම ලබන වරදක් වීය. මිසර ගෙදරක් ගින්නට හසුවූ විට එම ගෘහමූලිකයාගේ ප්‍රථම කාර්‍යය සියල්ලටම පළමු බළලා මුදාගැනීමය.

♦ ***Auntie Ramani*** (***රමණී නැන්දා***)

## තුති පුදම් ඔබට !

වෙඩි හඬින් දෙදරුම්ව
රතු ලෙයින් තෙත්ව ගිය
මව්බිමේ සටන් වැද
ජය ලැබූ විරුවනේ

නොපසු බට වීරියෙන්
දිනාගත් ඉන්ද්‍ර දිග
සතුරාට ඉඩ නොදෙනු
කිසිදාක ජයගන්න
ඔබේ දැඩි ශක්තියෙන්
මුදාගත් ඉන්ද්‍ර දිග
නිදහසින් සිනාසෙයි
ඔබේ සවි බලයෙන්ම

මෙතෙක් ඔබ කළ සටන
දිනාගන්නට දෙරණ
තුති පුදම් මේ ලෙසට
ලැබේවා තුන්සරණ

ඉතින් රණවිරුවනේ
මෙයයි මාගේ පැතුම
දිනේවා! ලක් දෙරණ
සාමයෙන් සැමදාම

♦ ***හසිනි මිලංකා විජයරත්න***
**අනුලා විද්‍යාලය**
**නුගේගොඩ**
**Sri Lanka**


ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

# ලංකා බැංකුව BANK OF CEYLON

## ලන්ඩන් ශාඛාව

**වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.**

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්‍යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.


★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***


ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**










# Confessions of an Economic Hit Man
# ආර්ථික ඝාතකයෙකුගේ පාපොච්චාරණයක් !

**මෙ**හි දක්වා ඇති පොත ලොව පුරා බුද්ධිමත් පාඨක ජනතාවගේ ඉමහත් සැලකිල්ලට භාජනයවී ඇති, එසේම මහත් ආන්දෝලනය කට තුඩුදුන් පොතකි. මෙය ප්‍රබන්ධයක් නොව සත්‍ය කතාන්තරයකි. එහෙත් මෙය ප්‍රබන්ධයක් තරමටම කුතුහලය, ත්‍රාසය සහ උද්වේගය කියවන්නා තුළ මොහොතක් පාසා ඇති කරයි. මෙම පොත වැදගත් වන්නේ අන් කිසිවක් නිසා නොව අද අප ශ්‍රීලංකාව වැනි දිළිඳු රටවල් වැටී පවතින දුක්ඛදායක තත්ව යන්ට හේතු මෙම පොතේ සවිස්තරව සඳහන් වන බැවිනි. අප වැටී සිටින අන්තරාය කොතරම්දැයි මට සැබැවින්ම පසක් වූයේ මෙම පොත කියවන්නට ලැබුණු පසුව ය.

මින්පෙර ලොව තිබුණු සියළු අධිරාජ්‍යයන් පරදවන විශාල අධිරාජ්‍යයක් ඇමරිකාව තනාගෙන යන බවත්, ඒ සඳහා කුඩා රටවල් සිය අතවැසියන් බවට යොදාගන්නා කූට උපක්‍රමත්, අන්තිමට එම දිළිඳු රටවල් ආර්ථික ගොහොරුවේ ගිලී ණයකාරයන් වන අයුරුත් මේ පොතේ පැහැදිලිව විස්තර කර ඇත. මෙතෙක් අප අනුමාන වශයෙන් සිතූ දේවල් දැන් සජීවී ලෙස සිදුවෙමින් පවතී. මෙම පොත ලියූ ලේඛකයා ජෝන් පර්කින්ස් එම ඇමරිකානු අධිරාජ්‍ය විසින් මෙහෙයවන ලද ආර්ථික ඝාතකයෙකු ලෙස වසර ගණනාවක් තුන්වන ලෝකයේ රටවල ක්‍රියාකාරී වී සිටියේය. එබැවින් එහි ඇතුළත හා පිටත අතැඹුලක්සේ දන්නා හෙතෙමේ සිය අවංක හර්ද සාක්ෂිය විසින් මෙහෙයවන ලදුව එම විෂම සංවිධානයෙන් ඉවත්ව සියළු ඇත්ත ලොව හමුවේ තබන්නට තීරණය කිරීම ලෝක ජනතාවගේ පිනක් ලෙස සැලකිය හැකිය.

Confessions of an Economic Hit Man නම් මෙම පොතේ පූර්විකාවේ ජෝන් පර්කින්ස් මෙසේ ලියා ඇත.

" It is your story too, the story of your world and mine, of the first truly global empire. History tells us that unless we modify this story, it is guarenteed to end tragically. Empires never last. Every one of them has failed terribly. They destroy many cultures as they race toward greater domination, and then they themselves fall. No country or combination of countries can thrive in the long term by exploiting others. "

" මේ ගොඩ නගන අධිරාජ්‍යයන් නොපවතින බවත් ඉතිහාසයේ මින්පෙර සිදුවී ඇති ලෙස ඒවා ඉතා දුක්ඛදායක ලෙස කඩාවැටෙන බවත්, එසේ කඩාවැටෙන්නේ බොහෝ ශිෂ්ටාචාරයන් සහ සංස්කෘතීන් විනාශකරගෙන බවත් පැහැදිලි ය. කිසිම රටකට හෝ රටවල් ගණනක එකතුවකට සෙසු රටවල් සූරාකෑමෙන් කිසි දාක දියුණුවනු හැකි නොවේ."

Confessions of an Economic Hit Man **ආර්ථික ඝාතකයෙකුගේ පාපොච්චාරණයක්** යන නමින් දැන් සිංහලෙන් ශ්‍රීලංකාවේ පළවී තිබේ. එය ඉතා කාලෝචිත ක්‍රියාවකි. අප රටේ ජනතාවට එක අතකට ඒ නිසා අද ලොව බල වත් රටවල ප්‍රයෝගකාරී ස්වභාවය තේරුම් ගැන්මට හැකිවේ. ඒ සැමට වඩා අප රටේ මිතුරන් කවුරුද සතුරන් කවුරුදැයි හඳුනා ගන්නා ක්‍රමෝපාය මේ පොත කියවීමෙන් වටහාගැන්මට නිසැකවම හැකිවෙනවා ඇත.

♦ ***වෙනුර***

## සුබ මංගලම් ! Wedding Greetings!



**Moises & Dilhani මොයිසස් සහ දිල්හානි**

ලන්ඩනයේ කලාවට ලැදි තරුණ යුවලක් වන ස්පාඤ්ඤ ජාතික මොයිසස් සහ සිංහළ යුවතියක වන දිල්හානි අබේසිංහ අතර නොබෝදා විවාහය සිදුවීය. එම මංගල්‍යය වෙනුවෙන් ප්‍රිය සම්භාෂණයක් පසුගියදා ලන්ඩනයේ **C&L Country Club** ශාලාවේ හිතවතුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණ. දිල්හානි ලන්ඩනයේ ප්‍රකට කලාකරුවන් දෙදෙනෙකු වන නාට්‍ය ශිල්පී ගාමිණී අබේසිංහ සහ නර්තනාචාරිණී කමලාංගනී පේරුසිංහ දෙදෙනගේ දියණියයි.

දිල්හානි - මොයිසස් නව යුවතිපතීන්ගේ නව දිවියට අපේ හෘදයාංගම ශුභාශිංසන පිරිනමමු!

**John Perkins** spent three decades as an Economic Hit Man, business executive, author, and lecturer. He lived and worked in Africa, Asia, the Middle East, Latin America, and North America. Then he made a decision: he would use these experiences to make the planet a better place for his daughter's generation. Today he teaches about the importance of rising to higher levels of consciousness, to waking up - in both spiritual and physical realms - and is a champion for environmental and social causes. He has lectured at universities on four continents, including Harvard, Wharton, and Princeton.